# 28

# පරිසරය සුරකිමු

හය වන වසරේ සිසුන් අධ්‍යාපන චාරිකාවකට  උඩරට ප්‍රදේශ වලට ගියා. එය සුන්දර හවස් යාමය කි. සියල්ලන් ම නුවරඑළියේ  තිබූ උද්‍යානයකට ඇතුළු වුණා. උද්‍යානයේ සිරි නරඹා ප්‍රීති වුණා. පසුව ඔවුන් ඉස්ලාම් විෂය භාර ගුරුතුමා වටා ඉඳ ගත්තා. එවිට ගුරුවරයා හා සිසුන් අතර මෙහෙම සාකච්ඡාවක් පැවතුණා.

ගුරුතුමාඃ

දරුවනි අප චාරිකාව සූදානම් කළ අවස්ථාවේ පරිසරය ගැන කතා කරනවා කියලා කිව්වා මතක ද? ඔබ මෙම චාරිකාවේ දී ප්‍රයෝජනවත් කරුණු රැසක් ම ඉගෙන ගත්තා. පරිසරයේ ඔබ නිරීක්ෂණය කළ ස්වාභාවික දර්ශන, එහි ප්‍රයෝජන, එය සුරැකීමේ වැදගත්කම ආදිය ගැන ඔබගේ අදහස්  පිළිවෙළින් කියන්න.



1වන ශිෂ්‍යයා

මම මේ පරිසරය ගැන හිතා බලනවා. කොපමණ ලස්සන දර්ශන ද? උස් කඳු, සිත පිනවන දිය ඇලි, කොළම කොළ පාට ගහ කොළ, නොයෙකුත් මිහිරි අන්දමින් නාද කරමින් සතුටු වන පක්ෂීන්, සිසිල් මඳ සුළඟ, පෙළට ඇදෙන ගව රැළ, මන බඳින ගොඩනැගිලි, මෙසේ බලන හැම තැනම සතුට ගෙන දෙන දර්ශන. මම මෙම ස්වාභාවික පරිසරයට බෙහෙවින් ම කැමැතියි.

ගුරුතුමා: හොඳ අදහස් ටිකක්. දරුවනි, මේවා අප වටා ඇති අපේ වටාපිටාව. අල්ලාහ් අපට ලබා දුන් දායාදයන් වන මේවා මිනිසා මැවීමට කලින් ම මහපොළොව මත මවනු ලැබූ ඒවා ය. අල්ලාහ් පොළොව මවා එහි කණු ලෙස කඳු සිටවූයේ ය. ඉන් පසු පොළොව කැළඹීමකින් තොරව නැවතුනි. එය මිනිසාටත් අන් ජීවින්ටත් ජීවත් වීමට සුදුසු ස්ථානයක් විය. හොඳයි ඔබගේ අදහස් කියන්න.

ශිෂ්‍යයා 2 : අප වටා පිහිටා ඇති පරිසරය අපගේ ජීවිතය සශ්‍රීක කරයි. අපගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට උදවු වෙයි. " මහ පොළව මත ඇති සියල්ල මවනු ලැබුවේ ඔබ වෙනුවෙන් " යැයි අල්කුර්ආනයේ සඳහන් වන්නේ ය. ඒවා සුරැකීම අපගේ යුතුකම වන්නේ ය.

3වන ශිෂ්‍යයා: මට කනගාටුයි. පරිසරය පිළිබඳ අවශ්‍ය තරම් අවබෝධයක් නොමැති නිසා වන විනාශය, රසායනික අපද්‍රව්‍ය හා අධික දුම නිසා ස්වාභාවික සම්පත් විනාශ වීම ආදිය සිදුවන්නේ ය. මේ නිසා ලොව ආහාර හිඟය, පානීය ජල හිඟය ආදිය උග්‍ර වෙනවා යන මෙම ප්‍රවෘත්තිය මම පුවත් පතකින් කියවූයෙමි.

4වන ශිෂ්‍යයා

මුස්ලිම් භක්තිකයෙකු තම පරිසරය දූෂණය නොකළ යුතු ය. ඊමානයේ ඇති පහළ ම තත්ත්වය පාරේ ඇති බාධක ඉවත් කිරීම කියා නබි (සල් ) තුමා පවසා තිබේ. අනවශ්‍ය ලෙස ගස් කැපීම ඉස්ලාම් තහනම් කර ඇත. "වගා කර කුසල් ලබා ගන්න. ගස් සිටවා පරිසරය අලංකාරවත් කරන්න" කියා ඉස්ලාම් උනන්දු කරයි. නබි (සල්) තුමා සල්මානුල් ෆාර්සි (රළි) යන මිත්‍රයාගේ නිදහස සඳහා සහා බාවරුන් මාර්ගයෙන් ඔහුගේ ස්වාමියාගේ වත්තෙහි රටඉඳි ගස් 300ක් සිට වූ සිද්ධිය කියවා ඇත්තෙමු.

ගුරුතුමා : දරුවනි, ඔබ ඉදිරිපත් කළ කරුණු සියල්ල සැබෑ ය. මෙය අල්ලාහ් මැවූ ලෝකයයි. මෙම ලෝකයේ ඇති සියල්ල අයිති අල්ලාහ්ට ය. ඒවා පොළවේ

අලංකාරය සඳහාත්, ආරක්ෂාව සඳහාත් මිනිසාගේ ජීවනෝපාය සඳහාත් මවා ඇත. මෙම භෞතික පරිසරය සුරැකීම අපගේ වගකීම හා යුතුකම වන්නේ ය. මේ ගැන ඔබ අදහස කුමක් ද?

5වන ශිෂ්‍යයා

මිනිසා විසින් දූෂණය කරනු ලබන වායුගෝලය ශාක මගින් පිරිසිදු කරනු ලබන්නේ ය. ජලාශ, පිට්ටනි, පළතුරු ගස් ඇති ස්ථාන වල මලපහ කර ඒවා අපිරිසිදු නොකළ යුතු ය. වට පිටාව ආරක්ෂා කිරීමෙන් අපගේ මනස යහපත් වන්නේ ය. සෞඛ්‍යය සුරැකෙන්නේ ය. ජීවිතය සශ්‍රීක වන්නේ ය.

6වන ශිෂ්‍යයා

පස සශ්‍රීක කිරීමට සහ ශාක නිෂ්පාදනයට ගැඩවිල්ලු සහ කෘමීහු සහාය වේ. එම නිසා සම්පූර්ණ පරිසරය ම සුරැකීම බුද්ධිමත් මිනිසාගේ යුතුකම වන්නේ ය. " ඔබට ලබා දුන් දාය ද ගැන අනිවාර්යයෙන් ම ඔබ ප්‍රශ්න කරනු ලබන්නේය." (102:8) යැයි අල්කුර්ආනය අවධාරණය කරයි. ලොව පිළිකුල් කරන ලෙස ඉස්ලාම් උපදෙස් දෙන්නේ නැත. කියාමා ජීවිතය අමතක නොකර ස්වාභාවික සම්පත් භාවිත කළ යුතු ය. ඒවා සුරැකිය යුතුයි. අනාගත පරම්පරාව සඳහා සශ්‍රීක පොළවක් ඉතිරි කර යා යුතු ය. මෙය අප සැමගේ යුතුකම වන්නේ ය.

ගුරුතුමා: දරුවනි, ඔබ වැදගත් කරුණු රැසක් කීවා. ඔබ වඩාත් හොඳ නිරීක්ෂණ ශක්තියක් ඇති අයයි. ඔබ වටිනා තොරතුරු රැසක් රැස්කර තිබෙනවා. පරිසරයේ ඇති සම්පත් සියල්ල අල්ලාහ්ගේ දායාදයන් ය. ඒවා ජීවීන්ගේ පැවැත්මට ඉතා අවශ්‍ය ඒවා ය. ඒවා දූෂණය නොකර ආරක්ෂා කිරීමත් ප්‍රයෝජනවත් කිරීමත් වැදගත් ය. එම නිසා අපි පරිසරය සුරකිමින් ජීවත් වෙමු.

අභ්‍යාසය

කෙටි පිළිතුරු සපයන්න

1. පරිසරය යනු කුමක් ද?
2. පරිසරයේ දක්නට ලැබෙන ස්වාභාවික සම්පත් තුනක් ලියන්න.
3. කඳු මවනු ලැබුවේ ඇයි?
4. පරිසරය දූෂණය කරන සාධක දෙකක් දෙන්න.
5. වටා පිටාව සුරැකීම නිසා ලැබෙන කුසලයන් දෙකක් සඳහන් කරන්න.
6. ස්වාභාවික සම්පත් කාගේ දායාදයන් ද ?
7. පාඩමේ සඳහන් වන අල්කුර්ආන් වාක්‍යය සඳහන් කරන්න.
8. පරිසරය සුරැකීම සඳහා අප අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග මොනවා දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.